සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2022

**10 ශ්‍රේණිය** **ඉතිහාසය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති අනෙකුත් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.

---

01. දීප වංශය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
    (1) ක්‍රි.ව. 5 - 6 සියවසේ රචනා කොට ඇත.
    (2) ලංකා ඉතිහාසය පිළිබඳ අඛණ්ඩව තොරතුරු ලබාගත හැක.
    (3) දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර පැරණිතම මූලාශ්‍රය වේ.
    (4) පුනරුක්ති දෝෂ දක්නට නැත.
02. අපේ සංස්කෘතික ඉතිහාසය පෙන්නුම් කෙරෙන ජීවමාන සාක්ෂි ඇතුළත් පිළිතුර මින් කුමක් ද?
    (1) සෙල්ලිපි, ගල්කණු හා වැව් (2) පැරණි චිත්‍ර, මූර්ති, කැටයම්
    (3) කාසි, නටබුන්, පුරාවස්තු (4) ආගමික විශ්වාස, ඇඳිහිලි, සිරිත් විරිත්
03. සාහිත්‍ය මූලාශ්‍රය ඇසුරින් තොරතුරු ලබාගැනීමේ දී අතීතය නිවැරදිව දැකීමට නම් විචාර බුද්ධියෙන් යුතුව එම මූලාශ්‍රය පරිශීලනය කළ යුතු වන්නේ,
    (1) ඓතිහාසික සිදුවීම් වලින් ශතවර්ෂ කිහිපයකට පසුව රචනා වී තිබීම නිසාය.
    (2) සාහිත්‍ය මූලාශ්‍රවල තොරතුරු බොහෝ විට සත්‍ය නොවන නිසාය.
    (3) ඓතිහාසික සිදුවීම්වලට සමකාලීන තොරතුරු ඇතුළත් වන නිසාය.
    (4) කතුවරුන්ගේ රුචි අරුචිකම් අනුව රචනා වීම නිසාය.
04. පැරණි ප්‍රාදේශීය මායිම් පෙන්වන සලකුණක් වන්නේ,
    (1) පුන්කලස (2) ලියවැල් (3) බල්ලා හා කපුටා (4) හක්ගෙඩිය
05. ක්‍රි.ව. 12 වන සියවසේ සිට ඉතිහාසය හැදෑරීමට වැදගත් වන අභිලේඛනමය මූලාශ්‍රයකි,
    (1) වල්ලිපුරම් රන් සන්නස (2) පනාකඩුව තඹ සන්නස
    (3) කව් සිළුමිණ (4) පැරකුම්බා සිරිත
06. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ප්‍රජාව ජීවත් වූ පරිසර කලාපයන් තීරණය කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබූ ප්‍රධාන සාධකය කුමක් ද?
    (1) ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය (2) කුඩා ගම්, වැව් ව්‍යාප්තිය
    (3) දඩයමෙන් ආහාර ලබාගත හැකි වීම (4) වාර්ෂික වර්ෂාපතන අගයන්
07. පූර්ව ඓතිහාසික යුගය ආරම්භ වන විටම මානව කටයුතුවල විශාල වෙනස්වීමක් වන්නේ මින් කුමක් ද?
    (1) එම මානවයින් ගනු ලැබූ ආහාර (2) භාවිතා කරන ලද මෙවලම්
    (3) වාසස්ථාන (4) ලෝහ භාවිතයට පමණක් යොමුවීම
08. ශ්‍රී ලංකාව තුළ කරන ලද කැණීම් අනුව පූර්ව ඓතිහාසික යුගයට අයත් සුසාන භූමි හමුවූ ස්ථාන වන්නේ,
    (1) රංචාමඩම හා ඉබ්බන්කටුව ය. (2) පාහියන්ගල හා ඉරණමඩු ය.
    (3) කිතුල්ගල බෙලිලෙන හා බෙරගල ය. (4) මිනිහාගල්කන්ද හා පොම්පරිප්පු ය.
09. ලංකාවේ භාවිත වූ පැරණිතම කාසි විශේෂය වන කහවනු නිර්මාණය කර ඇති ලෝහය වන්නේ,
    (1) රන් ය. (2) තඹ ය. (3) රිදී ය. (4) යකඩ ය.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

10. පහත I තීරුවේ දැක්වෙන තොරතුරු II තීරුවේ දැක්වෙන සාහිත්‍ය ග්‍රන්ථ අතර සම්බන්ධතාවයක් ඇත. I තීරුවේ අනුපිළිවෙල අනුව II තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. අතීතයේ හේන් වගාව සෙහෙන් ලෙස හැඳින්වීම | A කනපෙඩික |
| 2. වත් සිරිත් චාරිත්‍ර පිළිබඳ අධිකාරි | B කොරවක්ගල සෙල්ලිපිය |
| 3. රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානි | C කොතුරු ගැනා |
| 4. ගම් නායකයින් සුහදව කටයුතු කළ බව | D බුත්සරණ |

(1) A B C D (2) B A C D (3) C B A D (4) D C A B

11. අනුරාධපුරයේ නාගරික නැගීමට සෘජු බලපෑමක් ඇති නොවූ පැරණි වරාය වන්නේ,
(1) මාතොට ය. (2) ගොඩවාය ය. (3) ජම්බුකෝල පට්ටන ය. (4) ලංකා පටුන ය.

12. රජරට ශිෂ්ටාචාර සමයට අයත් සාහිත්‍ය කෘති, පාලි, සංස්කෘත හා සිංහල භාෂාවලින් ලියවී ඇති අතර එම කෘතිවලට උදාහරණ තුනක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර මින් කුමක් ද?
(1) සාරප්ථදීපනි, ජානකීහරණය, සියබස්ලකර (2) දීපවංශය, සාරප්ථදීපනි, සියබස්ලකර
(3) අනුරුද්ධ ශතකය, දීපවංශය, බාලාවබෝධය (4) අනුරුද්ධ ශතකය, ජානකීහරණය, සියබස්ලකර

13. A කවුඩුල්ල වැව ඉදිකිරීම.
B දසවෙනි රාජ්‍ය වර්ෂයේ දී ග්‍රාම සීමා නියම කිරීම.
C දළදා මාලිගාවේ ආරක්ෂාවට වේලක්කාර හමුදාව ගෙන්වීම.
D ජය වැව ඉදිකිරීම.
ඉහත තොරතුරු අතරින් පණ්ඩුකාභය රජු හා සම්බන්ධ තොරතුරු ඇතුළත් වන්නේ,
(1) A හා B ය. (2) B හා C ය. (3) B හා D ය. (4) C හා D ය.

14. රාජ්‍යත්වය පිළිබඳ ව්‍යවහාර වූ විවිධ සංකල්පයකින්ම රජුගේ උසස් බව හැඟවීමට උත්සාහ දරා ඇත. ඒතුළින් පාලකයා පිළිබඳ ජනතාව බලාපොරොත්තු වූයේ කුමක් ද?
(1) ආක්‍රමණකාරී වීම හා දැඩි තීරණ ගැනීම. (2) ආදර්ශවත්වීම හා ධාර්මික වීම.
(3) පරාර්ථකාමී බව හා සෘජු බව. (4) දැඩි තීරණ ගැනීම හා මෘදු බව.

15. ජලයේ හැසිරීම හෙවත් ජලයේ ගම්‍යතාව තේරුම්ගෙන වැවට එක්කළ යුතු අංගය කුමක් ද?
(1) රළපනාව (2) පිටවාන (3) බිසෝකොටුව (4) වැව් බැම්ම

16. පහත I තීරුවේ තොරතුරු II තීරුවේ තොරතුරු හා ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. අවකාශය | A කරිසය |
| 2. බර | B වස |
| 3. දිග | C අක |
| 4. කාලය | D රථරේණු |

(1) A C D B (2) A D B C (3) B C A D (4) C B D A

17. දැදිගම සූතිඝර චෛත්‍යය ඉදිකරවා ඇත්තේ කුමන රජ කෙනෙකුගේ උත්පත්තිය සිහිකරවීම සඳහා ද?
(1) I විජයබාහු (2) II පරාක්‍රමබාහු (3) I පරාක්‍රමබාහු (4) VI පරාක්‍රමබාහු

18. පහත දැක්වෙන බදුවර්ග අතරින් කෘෂිකාර්මික කටයුතු හා සම්බන්ධයෙන් අයකරන ලද බදු වර්ගයක් නොවන්නේ,
A දකපති B බොජකපති C මකර මජ්බක D කැතිඅඩ
(1) A (2) C (3) B (4) D

19. අතීත ජන සමාජයේ කැඳ වර්ග පානය ඉතා ජනප්‍රියව පැවති අතර බෙහෙත් ගුණ ඇති කොළ වර්ග යොදා සකසන ලද කැඳ වර්ග හැඳින්වූයේ,
(1) යවාගු (2) රස උළුකැඳ (3) උළුකැඳ (4) ඇඹුල්හඹු

20. පහත I තීරුවේ දැක්වෙන තොරතුරු II තීරුවේ දැක්වෙන තොරතුරු හා ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. මී, එළහරකුන්, එළුවන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම | A වේවැල්කැටිය සෙල්ලිපිය |
| 2. සොරකම් කිරීම, මිනීමැරීමට අදාළ දඬුවම් | B හෝපිටිගම ටැම්ලිපිය |
| 3. වෙළඳාම සම්බන්ධ නීතිරීති | C මිහින්තලා පුවරු ලිපිය |
| 4. ගස්කොලන් කලමනාකරණයේදී රජය විසින් පනවා තිබෙන නීතිරීතිවලට අනුකූල විය යුතු බව | D කොන්ඩවට්ටවාන් ටැම්ලිපිය |

(1) A C B D (2) B C A D (3) C A B D (4) D C A B

21. අනුරාධපුර නගරය සැලසුම් සහගත නිමාවයකින් යුක්තව නිර්මාණය කරන ලද රජු වන්නේ කවුද?

(1) පණ්ඩුකාභය රජු (2) දුටුගැමුණු රජු (3) වසභ රජු (4) මහසෙන් රජු

22. දඹදෙණිය රාජධානිය අයත් වන්නේ ශ්‍රී ලංකාවේ අතීත පාලන බෙදීම්වලට අනුව,

(1) රුහුණු රටට ය. (2) මායා රටට ය. (3) මලය රටට ය. (4) පිහිටි රටට ය.

23. III විජයබාහු රජුගේ පුතුන් දෙදෙනා වන්නේ පහත සඳහන් අය අතුරෙන් කවුරුන් ද?

(1) පරාක්‍රමබාහු හා විජයබාහු (2) මහා අස්ථාන හා විජයපාල

(3) බුවනෙකබාහු හා විජයබාහු (4) පරාක්‍රමබාහු හා බුවනෙකබාහු

24. කුරුණෑගල රාජධානි සමයේ රජකු වූ IV පරාක්‍රමබාහු ක්‍රි.ව. 1302 දී රජ වූ බවට සාධක ලැබෙන මූලාශ්‍රය වන්නේ,

(1) සද්ධර්මරත්නාවලිය (2) යාල්පාන වෛපමාලෛයි

(3) සරජෝතිමාලෛයි (4) දළදා සිරිත

- **පහත A, B, C, D, E අක්ෂර වලින් දක්වා ඇත්තේ එක් එක් යුගවල ලියවී ඇති සාහිත්‍ය ග්‍රන්ථයන් ය. ඒ ඇසුරින් 25, 26 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A සිදත් සඟරාව B බාලාවතාර C බුදුගුණාලංකාරය

D දළදා පූජාවලිය E සද්ධර්මාලංකාරය

25. දඹදෙණි යුගයේ රචනා කරන ලද මූලාශ්‍ර ඇතුළත් අක්ෂර දෙක දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා D (2) A හා E (3) B හා E (4) C හා D

26. ගම්පොළ යුගයේ දී හා කෝට්ටේ යුගයේ රචනා කරන ලද ග්‍රන්ථ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා B (2) B හා D (3) B හා C (4) D හා E

27. උඩරට පෘතුග්‍රීසි පාලනයක් ඇතිවීම වැළකුනේ කුමන හේතුවක් නිසාද?

(1) යමසිංහ බණ්ඩාර රජකම ලබාගැනීම ය.

(2) කරල්ලියද්දේ බණ්ඩාර පෘතුග්‍රීසින් වෙත පලායාම ය.

(3) උඩරට රදල ප්‍රධානීන් ශක්තිමත් වීම ය.

(4) උඩරැටියන්ගේ සහයෙන් කොනප්පු බණ්ඩාර උඩරට බලය අල්ලා ගැනීම ය.

28. මහනුවර රාජධානියේ ඉඩම් අයිතිය හා බුක්තිය නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| I තීරුව | | II තීරුව | |
|---|---|---|---|
| 1. | ගබඩාගම් | A | රදල ප්‍රධානීන් කළ සේවයට දුන් ඉඩම් |
| 2. | නින්දගම් | B | විහාරාරාම සඳහා පූජා කළ ඉඩම් |
| 3. | පරවේණිගම් | C | රජවාසල ප්‍රයෝජනය සඳහා |
| 4. | විහාරගම් | D | ගම් වැසියන් පරම්පරාගතව බුක්ති විඳි ඉඩම් |

(1) C A D B (2) A C B D (3) C B D A (4) D C B A

29. සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාරව ගමන් ගන්නා ලද බව සොයාගන්නා ලද්දේ,

(1) නිකලස් කොපර්නිකස් ය. (2) අයිසෙක් නිව්ටන් ය.

(3) ගැලිලියෝ ගැලිලි ය. (4) ජොහැන්නස් කෙප්ලර් ය.

30. අතීතයේ දී පෘතුග්‍රීසින් විසින් ලංකාව හඳුන්වන ලද්දේ කුමන නමකින් ද?

(1) තැප්‍රොබේන් (2) සෙයිලන් (3) සෙරන්ඩිබ් (4) සිංහල ද්වීපය

31. පෘතුග්‍රීසින් මෙරටට පැමිණෙන අවධියේ කෝට්ටේ පාලකයා ලෙසින් කටයුතු කළේ මින් කවුරුන් ද?

(1) VI පරාක්‍රමබාහු රජු (2) VII බුවනෙකබාහු රජු

(3) VIII වීර පරාක්‍රමබාහු රජු (4) VI විජයබාහු රජු

- **අංක 32, 33, 34 යන ප්‍රශ්නවලට පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| වර්ෂය | උඩරට පාලකයා | පෘතුග්‍රීසි සෙන්පතියා |
|---|---|---|
| A 1602 | E I විමලධර්මසූරිය රජු | H දොන් ජෙරනිමෝ ද අසවේදු |
| B 1630 | F සෙනරත් රජු | I දියෝගුද මෙලෝ |
| C 1598 | G II රාජසිංහ රජු | J පේරෝ ලොපේජ් ද සූසා |
| D 1638 | | K කොන්ස්තන්තිනු ද සා |

32. දන්තුරේ සටන සම්බන්ධ නිවැරදි පිළිතුර කුමක් ද?
    (1) AEK (2) BFH (3) CEK (4) CEJ
33. රන්දෙනිවල සටන හා සම්බන්ධ නිවැරදි පිළිතුර කුමක් ද?
    (1) BFK (2) DFH (3) CGJ (4) BGK
34. ගන්නොරුව සටන හා සම්බන්ධ නිවැරදි පිළිතුර කුමක් ද?
    (1) CGI (2) BEK (3) DGI (4) DFH

- **පහත A, B ප්‍රකාශ ඇසුරෙන් 35 හා 36 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A පල්ලියේ ආධිපත්‍ය විවේචනය වීම.

B මානවවාදය ඉස්මතු වීම.

35. පුනරුදය ඇතිවීමට බලපෑ හේතුවක් ලෙස
    (1) A සත්‍යයි B අසත්‍යයයි. (2) A හා B සත්‍යයයි.
    (3) A අසත්‍යයි B සත්‍යයයි. (4) A හා B අසත්‍යයයි.
36. පුනරුදයේ ප්‍රතිඵලයක් ලෙස
    (1) A සත්‍යයි B අසත්‍යයයි. (2) A හා B සත්‍යයයි.
    (3) A අසත්‍යයි B සත්‍යයයි. (4) A හා B අසත්‍යයයි.

- **පහත A, B, C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර බලා 37 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A 1. සීතාවක රාජධානිය
  2. රජු අනුගමනය කළ බෞද්ධ විරෝධී ප්‍රතිපත්තිය

B 1. රදල බලය බිඳවැටීම
  2. පුනරුදය

C 1. ජාතික රාජ්‍ය බිහිවීම
  2. මධ්‍යම පන්තිය

D 1. පෘතුග්‍රීසින්
  2. බතාවිය පාලන මධ්‍යස්ථානය

37. දෙවැන්න ඇතිවීමට පළමුවැන්න හේතුවක් වූ බව දැක්වෙන යුගලය කුමක් ද?
    (1) A (2) B (3) C (4) D
38. පළමුවැන්න හා දෙවැන්න අතර කිසිඳු සම්බන්ධතාවයක් නොදක්වන යුගලය කුමක් ද?
    (1) A (2) B (3) C (4) D
39. පළමුවැන්න නිසා දෙවැන්නට වැදගත්කමක් හිමිවූ බව දැක්වෙන යුගලය කුමක් ද?
    (1) A (2) B (3) C (4) D
40. පළමුවැන්නේ පරිහානියට දෙවැන්න බලපා ඇති බව දැක්වෙන යුගලය කුමක් ද?
    (1) A (2) B (3) C (4) D

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2022

**10 ශ්‍රේණිය** | **ඉතිහාසය - II** | **කාලය පැය 03 යි.**
**අමතර කියවීම් කාලය මිනිත්තු 10**

නම/ විභාග අංකයඃ

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

සැලකිය යුතුයි

- **I** කොටසේ ප්‍රශ්න අංක 01 අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න 4 ක් ද, **III** කොටසින් එක් ප්‍රශ්නයක් ද තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I - කොටස

(01) (අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.

පරාක්‍රම සමුද්‍රය, කැලණි ගඟ, ගල්ඔය, පදවිය වැව, කාලතිත්ථ, අලිමංකඩ, මඩකලපුව, අනුරාධපුරය, ඉබ්බන්කටුව, කල්පිටිය, අලුගල්ගේ, සීගිරිය (ල. 12)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

පොන්ඩිචෙරි, පිලිපීන් දූපත්, වතිකානුව, අරාබි මුහුදු, ස්පාඤ්ඤය, බොම්බාය (ල.06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනු පිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A කොළඹ ජාතික කෞතුකාගාරයේ ඇති කිරිගෙරි යන පදය සඳහන් සෙල්ලිපිය කරවූ රජු

B I විජයබාහු රජතුමාට සතුරු කරදර පැවති සමයේ ආරක්ෂාව ලබාදෙන ලද්දේ කවුද?

C II පරාක්‍රමබාහු රජුගේ දින චරියාව ඇතුළත් කෘතිය

D යාපන රාජධානියේ පාලන කටයුතු මෙහෙයවන ලද රජ පෙළපත (ල. 04)

A හා **B** යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. A අක්ෂරයෙන් දැක්වෙන පින්තූරයේ දැක්වෙන පුද්ගලයා නම් කරන්න.

2. ඔහු කුමන ජාතිකයෙක් ද?

3. මෙම පුද්ගලයා වැඩි කාලයක් ජීවත් වූ රට කුමක් ද?

4. ඔහු විසින් රචිත කෘතියක් ලියා දක්වන්න.



**A**

(ල. 04)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(iii) 1. B පින්තූරයේ දැක්වෙන ස්තූපය කුමක් ද?

2. එම ස්තූපය ඉදිකරවන ලද්දේ කිනම් රාජධානි සමයක ද?

3. එය ඉදිකර වූ රජු කවුද?

4. මෙම ස්තූපයේ ඓතිහාසික වශයෙන් ඇති වැදගත්කම කුමක් ද?



B

(ල. 04)

---

## II - කොටස

(02) (i) ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් දකුණු ඉන්දියාවේ දී රචිත ග්‍රන්ථ 3 ක් නම් කරන්න. (ල. 03)

(ii) පහත A, B, C, D සඳහන් මූලාශ්‍රයන්ට අදාළ පුද්ගලයන් ලියා දක්වන්න.

A - ඩිමුන්ඩෝ කෘතිය

B - පනාකඩුව තඹ සන්නස

C - ගල්පොත සෙල්ලිපිය

D - නැවුරාලියාස් හිස්ටෝරියා කෘතිය (ල. 04)

(iii) ලංකා ඉතිහාසය ගොඩනැගීමේ දී මහා වංශයේ වැදගත්කම කරුණු 2 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) ඉතිහාසය ගොඩනැගීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වැදගත් වන ආකාරය කරුණු 3 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 06)

(03) (i) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ප්‍රාග් ඓතිහාසික කැණීම් කරන ස්ථාන 3 ක් නම් කරන්න.(ල. 03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයින් ජීවත් වූ වෙරලාශ්‍රිත එළිමහන් වාසස්ථාන 2 ක් හා කඳුකර එළිමහන් දඩයම් වාසස්ථාන 2 ක් නම් කරන්න. (ල. 04)

(iii) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියේ දී සැලකිල්ලට ගනුලැබූ කරුණු 2 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පූර්ව ඓතිහාසික යුගය වෙන්කර හඳුනාගත හැකි කරුණු 3 ක් විස්තර කරන්න. (ල. 06)

(04) (i) පහත දැක්වෙන රාජ්‍යත්ව සංකල්ප වලින් හඳුන්වනු ලැබූ රජවරු A, B, C අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A - චක්‍රවර්ති

B - අලකපය මහරජ

C - නරේශ්වර (ල. 03)

(ii) අතීතයේ දී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළඳුන්ගේ අවධානය යොමුවීමට බලපෑ හේතු 2 ක් සඳහන් කරන්න. (ල. 04)

(iii) පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය සිදුවූ ප්‍රධාන ආකාර දෙක උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) I විජයබාහු රජුගේ වැදගත්කම කරුණු 3 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

(05) (i) අතීත ශ්‍රී ලංකාවේ ජනතාවගේ පොදු සෞඛ්‍යය පහසුකම් නඟාසිටුවීමට කටයුතු කළ පාලකයන් තිදෙනෙකු ලියා දක්වන්න. (ල. 03)

(ii) පාලන කටයුතු පවත්වාගෙන යාමේදී ගමිකගෙන් ඉටුවූ සේවාවන් 4 ක් ලියා දක්වන්න. (ල. 04)

(iii) අතීත ශ්‍රී ලංකාවේ විවිධ කර්මාන්ත පැවති බව කර්මාන්ත 2 ක් ඇසුරෙන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 05)

(iv) අතීත ශ්‍රී ලංකාවේ තාක්ෂණික දියුණුව ජල කලමනාකරණයට යොදාගනු ලැබූ ක්‍රමවේද 3 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 06)

(06) (i) පහත සඳහන් රාජධානිවල ආරම්භක පාලකයන් ලියා දක්වන්න.

(a) යාපහුව

(b) කුරුණෑගල

(c) කෝට්ටේ (ල. 03)

(ii) පහත A, B, C, D වල දක්වා ඇති ප්‍රාදේශීය පාලකයන් පිහිටුවන ලද පාලන මධ්‍යස්ථාන පිළිවෙලින් ලියා දක්වන්න.

A - සංඛ සෙනෙවි

B - බුවනෙකබා ආදිපාද

C - සුභ සෙන්පති

D - වන්නි විජයබාහු (ල. 04)

(iii) ගම්පොළ රාජධානි සමයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ 2 ක් දක්වා ඒ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු බිහිවූ දෙවන නාගරිකකරණ අවධියේ ආර්ථික රටාවේ කැපී පෙනෙන ලක්ෂණ 3 ක් දක්වා ඒ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 06)

07 (i) පහත සඳහන් පුද්ගලයන්ගේ බෞතීස්ම නාමයන් ලියා දක්වන්න.

(a) කුසුමාසන දේවිය

(b) යමසිංහ බණ්ඩාර

(c) කොනප්පු බණ්ඩාර (ල. 03)

(ii) පහත A, B, C, D වලට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා ලියා දක්වන්න.

A - I රාජසිංහ රජු විසින් සිදුකළ උඩරට ආක්‍රමණයට උපකාර කළ උඩරට ප්‍රභූවරයා

B - II රාජසිංහ රජු කුමාර කාලයේ හැඳින් වූ නම

C - අදිකාරම්වරුන්ගේ ආඥා හෝ පණිවිඩ ප්‍රාදේශීය නිලධාරින් කරා ගෙන ගිය පිරිස

D - කෝරලයේ එක් එක් කුල භාරව සිටි නිලධාරියා

(මහා අස්ථාන / කටුපුල්ලේ / මුහන්දිරම්වරු / වීරසුන්දර බණ්ඩාර / නිකපිටියේ බණ්ඩාර / විදානේවරු) (ල. 04)

(iii) I විමලධර්මසූරිය රජු මුහුණ දුන් අභියෝග 2 ක් හා ඒවා ජය ගැනීමට ක්‍රියා කළ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) උඩරට රාජධානියේ පරිපාලනය සිදු වූ ආකාරය පරිපාලන අංශ 3 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 06)

## III කොටස

(08) (i) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(a) පුනරුද සමයේ නව චිත්‍ර කලාවක් බිහිකළ මධ්‍යස්ථානය

(b) පුනරුද සමයේ ඉගැන්වීම ආරම්භ කළ මානවවාදී විෂයයන් දෙකක් නම් කරන්න. (ල. 03)

(ii) පහත A, B, C, D වලින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - මයිකල් ආන්ජලෝ විසින් කිරිගරුඬින් නෙලා ඇති මෙසිසි පවුලේ ප්‍රතිමාව කාගේ ද?

B - නිකලස් කොපර්නිකස් තාරකා විද්‍යාවට කළ සේවයට ඔහුව හඳුන්වා ඇති නාමය

C - මෙරට මුහුදුබඩ ප්‍රදේශවල පෘතුග්‍රීසින් ව්‍යාප්ත කළ ආගම

D - පුනරුද සමයේ ගත්කතුවරයකු මෙන්ම පල්ලියේ ආධිපත්‍යය ද විවේචනයට ලක්කළ ප්‍රංශ ජාතිකයා (ල. 04)

(iii) පුනරුදය නිසා ලංකාවේ ඇති වූ සමාජ සංස්කෘතික වෙනස්කම් 2 ක් දක්වා ඒ පිළිබඳ පැහැදිලි කරන්න. (ල. 05)

(iv) පුනරුද සමයේ කලා ශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් කලා ශිල්ප ක්ෂේත්‍ර 3 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 04)

(09) (i) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(a) පුනරුද සමයේ දේශගවේෂණය සඳහා මුලින්ම උනන්දු වූ සාගරබඳ රටවල් 2 ක්

(b) ප්‍රථමයෙන් ආසියාවට පැමිණි යුරෝපීය ජාතිකයා ගොඩබසින ලද වරාය (ල. 03)

(ii) පහත A, B, C, D හි සඳහන් සොයාගැනීම් කළ පුද්ගලයන් වරහන් තුළින් තෝරා ලියන්න.

A - නූතන ඖෂධ විද්‍යාව කෙරෙහි හා රෝග චිකිත්සක ක්‍රම කෙරෙහි විශාල බලපෑමක් ඇති කිරීමට බලපෑ සොයාගැනීම කළ පුද්ගලයා

B - ගුරුත්වාකර්ෂණ නියමය සොයාගැනීම

C - බටහිර ඉන්දියා දූපත් සොයාගැනීම

D - ඩිවිනා කොමඩියා ග්‍රන්ථය රචනා කිරීම

(පෙට්රාක් / අලගියරි ඩාන්ටේ / ක්‍රිස්ටෝපර් කොලොම්බස් / මයිකල් සර්වෙස් / පැරසල්සස් / අයිසෙක් නිව්ටන් / ගැලීලියෝ ගැලිලි) (ල. 04)


(iii) පුනරුදයේ බලපෑම නිසා ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(iv) නව මුහුදු මාර්ග සොයා යාමේ ගමන සාර්ථක කර ගැනීමට සුදුසු පරිසරයක් පුනරුද සමය වනවිට යුරෝපයේ සකස් වී තිබූ ආකාරය කරුණු 3 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

(01) (අ) (i)
(01) (***a***) (i)
(01) (அ) (i)



(01) (අ) (ii)
(01) (*a*) (ii)
(01) (அ) (ii)



## පිළිතුරු පත්‍රය - I කොටස


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(1) | 4 -(4) | 5 -(2) | 6 -(4) | 7 -(3) | 8 -(1) | 9 -(3) | 10 -(4) |
| 11-(2) | 12 -(1) | 13 -(3) | 14 -(2) | 15 -(4) | 16 -(1) | 17 -(3) | 18 -(2) | 19 -(4) | 20 -(3) |
| 21-(1) | 22 -(2) | 23 -(4) | 24 -(3) | 25 -(2) | 26 -(3) | 27 -(4) | 28 -(1) | 29 -(4) | 30 -(2) |
| 31-(3) | 32 -(4) | 33 -(1) | 34 -(3) | 35 -(1) | 36 -(3) | 37 -(2) | 38 -(4) | 39 -(3) | 40 -(1) |


(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (අ) (i) ලංකා සිතියමේ නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.

(ii) ලෝක සිතියමේ නිවැරදිව ලකුණු කර නම් කර ඇති ස්ථානවලට ලකුණු පිරිනමන්න.



(ආ) (i) A IV කාශ්‍යප රජතුමා B බුද්ධරාජ සෙන්පති / සිත්නාරු බිම් බුදල්නා
C කඳවුරු සිරිත D ආර්ය චක්‍රවර්ති පරපුර
(ii) 1. ක්ලෝඩියස් ටොලමි 2. ග්‍රීක රෝමානු
3. ඇලෙක්සැන්ඩ්‍රියාව 4. භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය
(iii) 1. ථූපාරාමය 2. අනුරාධපුර
3. දේවානම්පියතිස්ස රජු 4. ලංකාවේ නිර්මාණය කළ ප්‍රථම චෛත්‍යය

(02) (I) සීලප්පදිකාරම් / මණිමේඛලයි / පදිරුප්පත්තු
(ii) A ඇරිස්ටෝටල් B I විජයබාහු රජතුමා
C නිශ්ශංකමල්ල රජු D ප්ලිනි
(iii) * අඛණ්ඩව ඉතිහාසය ගොඩනගා ගත හැකි වීම.
* මහා වංශයේ තොරතුරු වෙනත් මූලාශ්‍ර වලින් සනාථ වීම.
* මහා වංශය රචනා කිරීමට පෙර ලියවුන වෙනත් මූලාශ්‍ර ගත කරුණු යොදාගැනීම.
ආදී කරුණු අතරින් දෙකක් පිළිබඳ අදාළ විස්තර ඉදිරිපත් කර තිබීම.
(iv) * සාහිත්‍ය මූලාශ්‍රවල තොරතුරු සනාථ කර ගැනීමට
* සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් නොවන ඇතැම් තොරතුරු දැන ගැනීමට
* වඩාත් විශ්වාසනීය බවකින් යුක්ත වීම.
ආදී තොරතුරුවලට අදාළ විස්තර

(03) (i) * කිතුල්ගල බෙලිලෙන * මානියම්ගම
* බටදොඹ ලෙන * පාහියන්ගල
* බෙල්ලන්බැඳිපැලැස්ස (මින් 3 ක්)
(ii) * වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන (මිනිහාගල්කන්ද, බූන්දල, පතිරාජවෙල)
* කඳුකර එළිමහන් දඩයම් වාසස්ථාන (බණ්ඩාරවෙල, හෝර්ටන්තැන්න)
(iii) * වාර්ෂික වර්ෂාපතන අගය * පසේ ස්වභාවය
* ජලවහනය * ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය * භූවිෂමතාව
යන කරුණු අතරින් දෙකක් පැහැදිලි කිරීමට ලකුණු ලබාදෙන්න.
(iv) * ස්ථිරවාසිතාව * කෘෂිකර්මාන්තය ඇරඹීම
* යකඩ භාවිතය ඇරඹීම * පිළිස්සූ මැටි වළං භාවිතය
* ක්‍රමවත් සුසාන විධි අනුගමනය

(04) (i) A කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල / නිශ්ශංකමල්ල B සීගිරි කාශ්‍යප / I කාශ්‍යප
C කුටකණ්ණාභය රජු
(ii) * ඉන්දියානු සාගරය හරහා වැටී තිබුණු මුහුදු වෙළඳ මාර්ගයේ මැද පිහිටි රටක් වීම.
* ශ්‍රී ලංකාව සතුව තිබූ මැණික්, ඇතුන් සහ කුළුබඩු වෙළඳුන්ගේ සිත් ඇදගත් වෙළඳ භාණ්ඩ බවට පත්ව තිබීම.
(iii) * පියාගෙන් පුතාට
උදා - පණ්ඩුකාභය → මුටසිව → දේවානම්පියතිස්ස
වසභ රජු → වංකනාසිකතිස්ස රජු
කාවන්තිස්ස රජු → දුටුගැමුණු රජු
* සහෝදරයාගෙන් සහෝදරයාට
දේවානම්පියතිස්ස රජුගෙන් පසු → උත්තිය, අසේල ආදී රජවරුන්ට
දුටුගැමුණු රජු → සද්ධාතිස්ස කුමාරයා
(iv) * රජරට චෝල ආක්‍රමණයෙන් මුදවා පොළොන්නරුව රාජධානියක් ලෙස ගොඩනැගීම.
* ලංකාවට නැවත විදේශීය ආක්‍රමණ එල්ල නොවන සේ රටවල් කිහිපයක් සමග රාජතාන්ත්‍රික සබඳතා ගොඩනගා ගැනීම.
(උදා- කාලිංග දේශයෙන් තිලෝකසුන්දරී කුමරිය විවාහ කර ගැනීම මගින් / පාණ්ඩ්‍ය දේශය තම නැගණිය මිත්තා කුමරිය පාණ්ඩ්‍ය කුමරුට විවාහ කර දීම මගින් / දකුණු ඉන්දියාව පොළොන්නරුවේ දළදා මාලිගයේ ආරක්ෂාවට වේලෙක්කාර හමුදාව ගෙන්වා ගැනීම මගින්)
* චෝල ආක්‍රමණය නිසා බිඳ වැටී ගිය වාරි පද්ධතිය නැවත පිළිසකර කිරීම.

(05) (i) බුද්ධදාස රජු / V මිහිඳු රජු / I උපතිස්ස රජු / IV කාශ්‍යප රජු
(ii) * ගමේ සුළු ආරවුල් විසඳීම.
* ගමේ වැව නඩත්තු කිරීම හා ජලය බෙදාහැරීම.
* ගම් අතර සිදුවන වෙළඳාම් කටයුතු සම්බන්ධීකරණය කිරීම.
* ගමේ පොදු වැඩකටයුතුවලදී නායකත්වය දීම.

(iii) * යකඩ කර්මාන්තය කබර, කම්මාර යන නම්වලින් හඳුන්වා තිබීම.
* කැත්ත, උදැල්ල, නගුල යන ගොවිතැන් කටයුතු වලට අවශ්‍ය භාණ්ඩ නිපදවීමට ප්‍රමුඛත්වය දීම.
* පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් මුතුගල්ල ස්ථානයේ තිබෙන සෙල්ලිපියක මජ්ජිම නම් කම්මල්කරුවකු පිළිබඳ තොරතුරු හමුවීම.
(පෙළ පොතේ පිටු 50 හා 51 අදාළ ඕනෑම කර්මාන්ත දෙකකට ලකුණු ලබාදෙන්න.)

(iv) වැව - වැවේ අංගවන සොරොව්ව, රළපනාව, බිසෝකොටුව, වැව් බැම්ම ආදී අංගයන් පිළිබඳ ඉදිරිපත් කරමින් පැහැදිලි කළ යුතුයි.
ඇළ මාර්ග - ඒ සඳහා තාක්ෂණය යොදාගත් ආකාරය
පොකුණු , ඌරාකැට ළිං ආදිය පිළිබඳ විස්තර කිරීම.

(06) (i) (a) I බුවනෙකබාහු (b) II බුවනෙකබාහු (c) VI පරාක්‍රමබාහු
(ii) A මිණිපේ ගංදෙණිය B ගෝවින්දමලය
C සුභ පබ්බත D දඹදෙණිය
(iii) * ප්‍රධාන රාජ්‍යයට අමතරව ප්‍රාදේශීය වශයෙන් රාජධානි කිහිපයක් ක්‍රියාත්මක වීම.
(උදා - උතුරේ ආර්ය චක්‍රවර්තීන් යටතේ, දැදිගම V පරාක්‍රමබාහු, රයිගම අලකේශ්වර පරපුර)
* රජ පවුලට අමතරව ප්‍රභූ පවුල් දෙකක් ඉස්මතු වීම.
(උදා- අලකේශ්වර පරපුර හා සේනාධිලංකාර පරපුර)
* උතුරේ ආර්ය චක්‍රවර්තීන් බලවත් වීම.
* සංදේශ සාහිත්‍යයේ ආරම්භය සිදුවීම. (උදා - තිසර, මයුර)
* චෙංහෝ සෙන්පතියාගේ ආක්‍රමණය සිදුවීම.
* ඉබන් බතුතා ලංකාවට පැමිණීම ආදී කරුණු 2 ක් විස්තර කිරීම.
(iv) * අහස් දියෙන් වගා කිරීම.
* ආයනය අපනයන ආර්ථිකයක් බිහිවීම්
* විදේශ රටවල් කිහිපයක් සමග වෙළඳ සබඳතා ගොඩනගා ගැනීම. (පිටුව 103 ට අනුව)

(07) (i) (a) දෝන කතිරිනා (b) දොන් පිලිප් (c) දොන් ජුවන්
(ii) A වීරසුන්දර බණ්ඩාර B මහා අස්ටාන
C කටුපුල්ලේ D මුහන්දිරම්
(iii) * උඩරට රාජ්‍යත්වය පිළිබඳ නීත්‍යානුකූල අයිතිය
* උඩරට විවිධ ආක්‍රමණවලින් මුදවා ගැනීම.
උදා - සීතාවක ග්‍රහණයෙන්, පෘතුග්‍රීසි ආක්‍රමණ වලින්
* පරිහානියට පත් බුදු දහම නගාසිටුවීම.
* ආර්ථිකය නගාසිටුවීම.
(iv) මහ වාසය, රටවසම හෙවත් ප්‍රාදේශීය පාලනය, බද්දෙ සංවිධානය හා විහාර දේවාලගම් පාලනය යන අංශ 4 න් 3 ක් පිළිබඳ පැහැදිලි කළ යුතුයි. (පෙළ පොතේ පිටු අංක 112 - 113)

(08) (i) (a) ෆ්ලෝරන්ස් (b) සාහිත්‍ය, ඉතිහාසය, කලාව, නීතිය, ආචාර විද්‍යාව
(ii) A ලොරෙන්සෝ මෙඩිසි B තාරකා විද්‍යාවේ පියා
C රෝමානු කතෝලික D ඉරාස්මස්
(iii) * බටහිර චින්තනය
* යුරෝපයේ ආගමික නිකායන් පැතිරීම.
* බටහිර අධ්‍යාපන ක්‍රමය ප්‍රචලිත වීම.
* බටහිර ගෘහ නිර්මාණ (උදා- දේවස්ථාන වැනි ගොඩනැගිලි)
(iv) චිත්‍ර කලාව, ප්‍රතිමා කලාව, ගෘහ නිර්මාණ ශිල්පය යන අංශයන්වල සිදු වූ වෙනස්කම් උදාහරණ දක්වමින් පැහැදිලි කළ යුතුය.

(09) (i) (a) පෘතුගාලය, ස්පාඤ්ඤය (b) කැලිකට් වරාය
(ii) A පැරසල්සස් B අයිසෙක් නිව්ටන්
C ක්‍රිස්ටෝපර් කොලොම්බස් D අලගියරි ඩාන්ටේ
(iii) * සම්ප්‍රදායික රාජාණ්ඩුක්‍රමය බිඳවැටී පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් බිහිවීම.
* සම්ප්‍රදායික නිලතල බිඳවැටී නව නිලධාරි පැලැන්තියක් බිහිවීම. නව නීති පද්ධති හඳුන්වා දීම.
(iv) * මාලිමා යන්ත්‍රය, උතුරු මාපකය වැනි නිපයුම් නිසා නාවික ගමන් සුරක්ෂිතව සිදුකිරීමට හැකිවීම.
* ලෝකය ගෝලාකාර බව සොයාගැනීම.
* ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝකය පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම.
* ජාතික රාජ්‍යයන් මෙම ගමන් සඳහා අනුග්‍රහ දැක්වීම.